

# 14

# වහී හි වැදගත්කම



**හාරිස්:-** අස්සලාමු අලයිකුම් පඬිතුමණී. ඔබ සමග කතා කිරීමට සුළු මොහොතකට අවසර දිය හැකි ද?

**පඬිවරයා:-** වඅලයිකුමුස්සලාම් වරහ්මතුල්ලාහි වබරකාතුහු. ඇයි එහෙම අසන්නේ. ඇති පමණ කතා කළ හැකි යි.

**හාරිස්:-** වහී පිළිබඳ ව විමසා දැන ගෙන එන ලෙස අපගේ ගුරුතුමා පැවසුවා. ඒ පිළිබඳ ව දැන ගැනීමට පැමිණියෙමි.

**පඬිවරයා:-** හොඳයි. අසුන් ගන්න. ඔබගේ ගැටලු විමසන්න.

**හාරිස්:-** ඥානය, ඉන්ද්‍රිය ඥානය හා විචක්‍ෂණ ඥානය වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වයි. ඒ දෙක අතරින් වහී කුමන කොටසට අයත් වේ ද?

**පඬිවරයා:-** ඉන්ද්‍රිය ඥානයට මෙන්ම විචක්ෂණ ඥානයට ඉහළින් වූ ඥානය වහී ලෙස හැඳින්වේ. ඉන්ද්‍රිය ඥනය හා විචක්ෂණ ඥනය මිනිසා තුළ පෝෂණය වී මිනිසාගේ වර්ධනයත් සමග එය ද මුවහත් වේ. එහෙත් වහී එසේ නොවේ. ඇත්තෙන් ම එය මුලින් කී වර්ග දෙකෙහි ඇති ඥානය සම්බන්ධ කර මිනිසාට සත්‍යයේ මග පෙන්නුම් කරයි.

**හිෂාම්:-** එය ටිකක් විස්තරාත්මක ව කිව හැකි ද?

**පඬිවරයා:-** සියලු ම ජීවින්ට ඉන්ද්‍රියයන් පදනම් කොටගත්, ඒවායෙහි අවශ්‍යතාවට අනුව සීමා කරන ලද ඥානයක් ලබා දී ඇත. මිනිසා මෙම ඉන්ද්‍රිය ඥානය සමග සිතුවිලි පදනම් කර ගනිමින් විචක්ෂණ ඥානය ලබා ගෙන ඇත. විචක්ෂණ ඥානය ඇති මිනිසාට ඍජු මාර්ගය තෝරා ගැනීම සඳහා උදව්වක් ලෙස වහී තුරින් දැනුම ලබා දෙනු ඇත. මෙය එක් එක් මිනිසාට තනි තනි ව ලබා දී නොමැත. ඒ වෙනුවට මිනිසුන් අතරින් තෝරා පත් කර ගන්නා ලද නබිවරුන්ට ලබා දී ඔවුන් එය ගෙන හැර දැක්ම මගින් අන් මිනිසුන් වෙතට එය ලැබී ඇත.

**හිෂාම්:-** වහී යන පදයේ අර්ථය පැහැදිලි කළ හැකි ද?

**පඬිවරයා:-** භාෂාමය වශයෙන් වහී යන පදය සංඥාව, පිබිදීම, සිතෙහි ඇතිවීම, පණිවිඩ පැවසීම, රහසිගත කථනය යන අදහස් ගෙන දෙයි. අල් කුර්ආනයේ වහී යන පදයට අර්ථ රැසක් භාවිත කර ඇත. අන් අයට නොදැනෙන පරිදිත් ග්‍රාහකයාට පමණක් ග්‍රහණය වන පරිදිත් පුවතක් ඉතා වේගයෙන් හා ඉතා රහසිගත ව හුවමාරු කිරීම යනුවෙන් ද, අන් අයට නොදැනෙන ආකාරයට ඉතා රහසිගත ව හා ඉතා වේගයෙන් අල්ලාහ් තආලා මගින් ඔහුගේ ධර්ම දූතයාට පහළ කරන ලද අල්ලාහ්ගේ කථනය යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

**හිෂාම්:-** වහී මත්ලුව් යනුවෙන් ද, වහී ගෛරු මත්ලුව් යනුවෙන් ද වහී වර්ග දෙකක් ඇති බව පවසනවා නේද? ඒ පිළිබඳව පවසන්න පුළුවන් ද?

**පඬිවරයා:-** වහී මත්ලුව් යනු අල්ලාහ් ජිබ්රීල් (අලෛ) මගින් රසූල්වරුන්ට පාරායනය කර පෙන් වූ වහී වේ. රසූල්වරු එය එලෙස ම ජනතාවට පාරායනය කර පෙන්වති. මිනිසා එය තම අවශ්‍යතාව අනුව වාචික ව ද ලිඛිත ව ද ආරක්ෂා කර ගත්තේ ය. මේ සඳහා උසස් ම නිදසුන අල් කුර්ආනය වේ. නබි සල් තුමාණන්ට පාරායනය කර පෙන්වන ලද මෙය වනපොත් ක්‍රමයෙන් ද පැවත ආ අතර ලේඛන ක්‍රමයෙන් ද වර්තමානය දක්වා එයාකාරයෙන් ම ආරක්ෂා වී ඇත. මෙය අල් කුර්ආනයට පමණක් ලබා දී ඇති විශේෂත්වයකි.

**හාමිද් :-** වහී ගෛරු මත්ලුව් යනු කුමක් ද?

**පඬිවරයා:-** මෙහි අදහස පාරායනය කර නොපෙන් වූ වහී යන්න ය. මෙය විවිධ ආකාරයෙන් දේව ධර්ම දූතයන්හට හිමි වුණි.

**හාමිද් :-** මෙයට නිදසුන් කිහිපයක් පෙන්නුම් කළ හැකි ද?

**පඬිවරයා:-** ඉබ්‍රාහිම් (අලෛ) තුමා තම පුත් ඉස්මායිල් (අලෛ) තුමාව කුර්බාන් කරන ලෙස සිහිනයක් දුටුවේ යැයි සූරතුස් සාෆ්ෆාත් හි 102 වැකියෙහි සඳහන් නොවේ ද? එවැනි සත්‍ය සිහිනයන් මෙහි අන්තර්ගත වේ. එසේ ම මූසා (අලෛ) තුමා තුර්සිනා කන්ද අසලින් යන විට ශබ්දාකාරයෙන් හඬක් නොඇසුණේ ද? අල්ලාහ් එතුමා සමග හඬකින් සංවාදයේ යෙදුණේ ය. Zසකරියියා (අලෛ) තුමා තම සමාජයට සංඥා මගින් අල්ලාහ් නැමදීමට ද, ප්‍රශංසා කිරීමට ද ඉගැන්වූයේ ය. යනුවෙන් අල් කුර්ආනයේ සඳහන් වේ. මෙය ද එයට අයත් වේ. මෙලෙස ම මුහම්මද් (සල්) තුමාණන්ගේ හදීසයන් ද වහී ගෛරු මත්ලුව් යනුවෙන් හඳුන්වනු ලැබේ.

**හුදෙයිෆා :-** වහී හි වැදගත්කම පිළිබඳ ටිකක් විස්තර කළ හැකි ද?

**පඬිවරයා:-** මෙතෙක් පැවසුවේ මිනිසාට ඍජු මග ලැබීමට නම් වහී හි ඥානය අවශ්‍ය බව යන්න ඔබට අවබෝධ වී ඇත. ඒ හැර වෙනත් හේතූන් ද ඉදිරිපත් කළ හැකි ය. අල්ලාහ් මිනිසා පරීක්ෂා කිරීම සඳහා මනෝ ඉච්ඡාව යන පොළඹවීම ඔහුට ලබා දී ඇත. මනෝ ඉච්ඡාව මිනිසාගේ විචක්ෂණ ඥානයට අදාළ හොඳ හා නරක පිළිබඳ සිතීමට නොදී ලෝක ආස්වාදය වෙතට ඔහුව ඇද ගැනීමට උත්සාහ කරයි. මෙම අවස්ථාවේ දී වහී දැනුම මිනිසාට හොඳනරක, හරිවැරදි පිළිබඳ අවබෝධය ලබා දෙයි. එය විශ්වාස කර ජීවත් වන මිනිසා ක්‍රමයෙන් මනෝ ඉච්ඡාව ජය ගනියි.

තව ද විශ්වය තුළ විවිධාකාර වූ මැවීම් දක්නට ලැබේ. එයින් බොහොමයක් මිනිසාගේ ඉන්ද්‍රියයන්ට ගෝචර නොවේ. මක්නිසා ද යත් මිනිසාගේ ඉන්ද්‍රියයන් වල සංවේදී බව සීමා කර ඇත. සමහර ජීවීන් මිනිසාට වඩා අධික ඉන්ද්‍රිය ඥානයකින් යුක්තය. විද්‍යාඥයන්ගේ ප්‍රකාශ මෙයට කදිම නිදසුන් ය. මිනිසාගේ ඉන්ද්‍රියයන්ට ගෝචර නොවන විවිධ සත්‍යයන් වහී මගින් පැහැදිලි කෙරේ. එහෙත් බොහෝ දෙනෙක් ඉන්ද්‍රිය ඥානය ගැන පමණක් විශ්වාසය තබා වහී මගින් පවසන සත්‍යය ප්‍රතික්ෂේප කරති. මෙම අදහස අස්ථිර ය. මෙවැනි මිනිස්සුන් තම ඉන්ද්‍රියයන්ගෙන් වටහා නොගත් බැවින්, පෘථිවිය පැතලිය යැයි විශ්වාසය කර එය ගෝලාකාරය යැයි පැවසූ විද්‍යාඥයන් ඝාතනය කිරීමට ද උත්සාහ දැරූහ.

පෘථිවියේ අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස මිනිසා අල්ලාහ්ට හා ඔහුගේ මැවීම් අතර ඇති සම්බන්ධතාව දැන ගැනීමට වහී පමණක් මග පෙන්වීම ලෙස පවතියි.

**හිෂාම්:-** පඬිවරයාණනි! මිනිසාගේ ඉන්ද්‍රීය ඥානයෙන් පමණක් දැන ගත නොහැකි කරුණු පැවසිය හැකි ද?

**පඬිවරයා:-** මිනිස් සිතෙහි ඇති වන සමහර මූලික ගැටලුවලට පවා ඉන්ද්‍රිය ඥානය මගින් හෝ විචක්ෂණ ඥානයෙන් හෝ පමණක් නිවැරදි පිළිතුරු පැවසිය නොහැකි ය. එලෙස පිළිතුරු දීමට ප්‍රයත්න දැරූ මිනිසා, පිළිම දෙවියන් ලෙස සැලකීය. දෙවියකු නොමැත යැයි පැවසුවේ ය. මිනිසා වානරයාගෙන් බිහි විය යැයි පැවසුවේ ය.

**හුදෙයිෆා :-** මිනිස් සිතෙහි උද්ගත වන මූලික ගැටලු මොනවා දැයි පැවසිය හැකි ද?

**පඬිවරයා :-** මා කවුද?
කොහි සිට පැමිණියෙම් ද?
යන්නේ කොයි දෙසට ද ?
මාගේ උපතේ අරමුණ කුමක් ද?
මෙම ගැටලු ඒවා ය. ඒවාට වහී හි ආධාරය නොමැති ව ඉන්ද්‍රීය ඥානයත් විචක්ෂණ ඥානයත් පාදක කොට ගෙන පමණක් කිසිවිටක නිශ්චිත පිළිතුරක්

පැවසිය නොහැකි ය. පිළිතුරු නිවැරදි ව නොලද විට මිනිසා වැරදි මාර්ග යක ගමන් කරයි. දෙවියන් ප්‍රතික්ෂේප කරන නාස්තිකවාදීන් ද පරලොව ප්‍රතික්ෂේප කරන ලෞකිකවාදීන් ද මෙයට කදිම නිදසුන් ය.

**හාරිස්** :- පඬිවරයාණනි, මෙතෙක් වේලා අප සමග සිට අපගේ ගැටලුවලට පැහැදිලි විස්තරයක් ලබා දුන් ඔබට අල්ලාහ්ගේ දයාව හිමි වේවා! යයි පතමින් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු. ජzසාකල්ලාහු කයිරන් කසීරා.

**පඬිවරයා** :- සිසුවනි, කරුණු සොයා ඉගෙන ගැනීමට ඉදිරිපත් වූ ඔබගේ දැනුම අල්ලාහ් පුළුල් කරත්වා!

**අභ්‍යාස**

1. වහී හි ප්‍රධාන කොටස් මොනවා ද? උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

2. වහී පහළ කරන ක්‍රම මොනවා ද?

3. වහී පහළ කිරීමේ අරමුණු ගෙනහැර දක්වන්න.

4. ඉන්ද්‍රිය ඥානය, විචක්ෂණ ඥානය යන දෙවර්ගයට වඩා වහී දැනුම ශ්‍රේෂ්ඨ වේ, යන්න විස්තර කර පෙන්වන්නේ කෙසේ ද?